# 10

# අපේ දක්ෂකම්

පස්සර මහා විද්‍යාලයේ සිසු සිසුවියෝ බිත්ති පුවත්පත් සකස් කිරීමට වැඩි ආශාවක් දක්වති. ඒ සඳහා පන්ති මට්ටමෙන් තරග පැවැත්වීමට නියමිතයි. එය ඔවුන්ගේ විවිධ හැකියාවන් පෙන්විය හැකි වැදගත් අවස්ථාවකි. නවවන ශ්‍රේණියේ සිසු සිසුවියන් තරගකාරී ලෙස බිත්ති පුවත්පතකට නිර්මාණ සකස් කරන ආකාරය මෙහි ඇතුළත් වේ.



"ගිහාන් ඔයා බැලුවා ද කමල් ලියලා තියෙන මේ නිර්මාණය?"

"ඔව් බැලුවා, ඒක හොඳයි. මේ ඉසුරු ලියලා තියෙන නිර්මාණය බලන්න."

"ඔක්කොම කියවලා බලලා හොඳ නිර්මාණ තෝරා ගනිමු."

“ගයාන්, අපේ කණ්ඩායමේ ලිපියත් ගිහාන්ට බලන්න දෙන්න.”

“හරි, ඕක ඔයා ම කියවන්නකෝ.”

“මෙහි මාතෘකාව ඒන්ජල් දියඇල්ල.”

“ලෝකයේ උස ම දියඇල්ල පිහිටා තිබෙන්නේ වෙනිසියුලාවේ ය. ඒ ටෙපයි කඳු වැටියේ පිහිටි පරේකුපාමෙරු දිය ඇල්ලයි. උස අඩි 3212 කි. මෙහි උසේ ප්‍රමාණය ඉතා වැඩි නිසා ම දියඇල්ලෙන් ඇද හැලෙන ජල කඳ සුළඟ සමග මුසු වී මීදුමක් බවට පත් වේ.

මේ දියඇල්ල නිසා ප්‍රසිද්ධ වූ පුද්ගලයෙක් සිටී. ඔහු “ජිමී ක්‍රෝෆෝඩ් ඒන්ජල්” ය. ඔහු ‘ෆ්ලෙමින්ගෝ’ නැමැති තමන්ගේ ගුවන් යානය කඳු මුදුනට ඉහළින් පියාසර කරවී ය. එය ටෙපයි කඳු මුදුනට ගොඩබැසීමට තැත් කිරීමේ දී ආපදාවට පත් වී ය. ජිමී ක්‍රෝෆෝඩ් ඒන්ජල් ද එම යානයේ ගමන් ගත් සියලු දෙනා ද ටෙපයි සිට පා ගමනින් ම ගොස් ජීවිත බේරා ගත්හ. මඩේ එරුණු යානය අවුරුදු 33ක් ඒ අයුරින් ම තිබිණ. මෙම සිදුවීම නිසා දිය ඇල්ල “ඒන්ජල්” නමින් ප්‍රසිද්ධ විය.

ලක්ෂ ගණන් ජනයා ‘ඒන්ජල් දියඇල්ල’ නැරඹීමට පැමිණෙති. අහස වලාකුළින් බර වුණු දිනවල මෙහි සුන්දරත්වය නැරඹිය නො හැකි ය.”

“හොඳයි ඒක හොඳ විදෙස් තොරතුරක්”

“රසිකලාගේ කණ්ඩායමත් හොඳ නිර්මාණයක් කරලා ඇති.”

“අපි ලියලා ඉවරයි. අපි ලිව්වේ පාසල් ප්‍රවෘත්තියක්. මම කියවන්නම්; ඔන්න අහගන්න.”

“කනිෂ්ඨ සාහිත්‍ය සංගමය මගින් වාර්ෂික ව පැවැත්වෙන ගායනා හා කථික තරග සඳහා දැන් අයදුම්පත් භාර ගැනේ. හය වන ශ්‍රේණියේ සිට නවවන ශ්‍රේණිය දක්වා ශිෂ්‍යශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම් කළ හැකි ය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය අප්‍රේල් මස අට වන දා ය. සාහිත්‍ය සංගමයේ ලේකම් වෙතින් අවශ්‍ය ඉල්ලුම් පත්‍ර ලබා ගත හැකි ය.”

"හොඳයි රසික, ඔය ප්‍රවෘත්තිය බිත්ති පුවත්පතට දමන්න."

"එතකොට කෝ, මේ ගීතලාගේ කණ්ඩායමේ නිර්මාණය?"

"මේ තියෙන්නේ ගයාන්"

"අපි ලිව්වේ අපේ පන්ති භාර ගුරුතුමිය ගැන. ලබන මාසේ අපේ පන්ති භාර මැණිකේ ගුරුතුමිය විශ්‍රාම යනවනේ."

"2002 වර්ෂයේ අද වගේ දවසක අලුත් ගුරුතුමියක් අපේ පන්තියට ආවා ය. ඈ ප්‍රාථමික පන්ති සඳහා ඉගැන්වීම් කටයුතු කළා ය. එද අපට ඉගැන්වූ ටිං ටිං ගානා......." මගේ පොඩි ලේනා ගීය තවමත් මගේ මතකයේ තිබේ. එවිට මා සිටියේ තුන්වන ශ්‍රේණියේ ය. අපි කවුරුත් මැණිකේ ගුරුතුමියට බොහෝ ආදරය කළෙමු. අප හැම දෙනා ම ගුරුතුමියගෙන් ඉගෙන ගත්තේ ඉතා ආශාවෙන්. ළමයින් පමණක් නොව දෙමව්පියෝ ද මේ ගුරුතුමියට කැමැත්තක් දක්වති. ඒ ඇය දරු දැරියන්ට දක්වන ආදරය නිසා ය. ඈ මිහිරි හඬින් කවි, ගී ගායනා කරන විට අපි වශී වූවන් මෙන් අසා සිටිමු."

"මාර්තු මස 31 වන දා ආදරණීය ගුරුතුමිය විශ්‍රාම ගැනීමට නියමිත ය. ඒ වෙනුවෙන් දෙමව්පියෝ හා සිසු දරුදැරියෝ උපහාර උත්සවයක් පැවැත්වීමට අදහස් කරති. මේ සඳහා පාසල් සංවර්ධන සමිතියේ සහාය ද ලැබේ. ගුරු මැණියන්ට උපහාර පිදීම සඳහා අපි සැමදෙනා එක්වෙමු."

"හරි අපූරුයි. එහෙනම් අපි මේ ලිපියත් තෝරා ගනිමු."

## ක්‍රියාකාරකම 01

මෙම පාඩම අවබෝධයෙන් යුතු ව කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කරන්න.
இப்பாடத்தை விளங்கி வாசித்து பின்வரும் வினாக்களுக்கு விடை தருக.

i. ලෝකයේ උස ම දියඇල්ල ගැන මෙහි සඳහන් තොරතුරු කියන්න.

ii. ජිම් ක්‍රෝෆෝඩ් ඒන්ජල් ප්‍රසිද්ධියට පත් වුණේ ඇයි?

iii. මෙහි සඳහන් ප්‍රවෘත්තිය පාසල් ළමයින්ට වැඩදායක වන්නේ කෙසේ ද?

iv. මැණිකේ ගුරුතුමිය දෙමව්පියන්ගේ හා සිසු දරුදැරියන් අතර ජනප්‍රිය වූයේ ඇයි?

v. ඇය විශේෂ හැකියාවක් දැක්වූයේ කුමක් සඳහා ද?

## ක්‍රියාකාරකම 02

පාඩමේ ඇතුළත් ප්‍රවෘත්තිය හොඳින් කියවා එයට මාතෘකාවක් යෝජනා කරන්න.
பாடத்தில் உள்ளடங்கியுள்ள செய்தியை நல்லமுறையில் வாசித்து அதற்குத் தலைப்பொன்றை இடுக.

## ක්‍රියාකාරකම 03

මැණිකේ ගුරුතුමියගේ චරිතයෙහි ඇතුළත් විශේෂ ගුණාංග කෙටියෙන් ලියන්න.
மெனிகே ஆசிரியையின் வாழ்க்கை நடத்தையில் உள்ளடங்கியுள்ள விஷேட குணநலன்களை சுருக்கமாக அழுதுக.

## ක්‍රියාකාරකම 04

i. 'ෆ' අක්ෂරය ලියන රටාව බලන්න. 'ෆ' අකුර සහිත වචන ඇතුළත් වාක්‍ය අභ්‍යාස පොතේ රූල් අතරෙහි ලියන්න.
'ෆ'எனும் எழுத்தை எழுதும் முறையை அவதானிக்க 'ෆ' எழுத்தையுடைய சொல்லைக் கொண்ட வாக்கியங்களை வரிகளில் எழுதுக.



පණිවුඩ ෆැක්ස් මගින් ද යැවිය හැකි ය.

අපේ පන්තියේ නායිකාව ෆ්ලෝරා ය.

ii. ජිරාෆ්, ෆරීඩා, කැලිෆෝනියාව, ෆ්ලොරිඩා ප්‍රාන්තය, ෆැන්ටා, ලයිෆ්බෝයි, ඔක්ස්ෆර්ඩ්, කෆීර් යානා, යන වචන යොදා වාක්‍ය එක බැගින් ලියන්න.

iii. 'ෆ' අක්ෂරය යෙදෙන වෙනත් වචන සොයා අභ්‍යාස පොතේ ලියන්න. ඒවා ඇසුරු කරගෙන වාක්‍ය තනන්න.
'ෆ' எழுத்துடனுள்ள வேறு சொற்களைத் தேடி அப்பியாசப் புத்தகத்தில் அவற்றை சேகரித்து வாக்கியம் எழுதுக.

## ක්‍රියාකාරකම 05

වනයේ ඇවිදීමට ගිය මිතුරෝ දෙදෙනෙක් අතරමං වෙති. ඔවුන් දෙදෙනා උපක්‍රමශීලී ව කටයුතු කළ නිසා වනයෙන් එළියට ඒමට හැකි වේ. මෙම අවස්ථාව මුල් කරගෙන "වන මැද අතරමං වීමු" යන මැයෙන් වාක්‍ය දහයක් ලියන්න.

## ක්‍රියාකාරකම 06

රූපවාහිනී හෝ ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයට සවන් දී එහි කියැවුණු විදේශීය ප්‍රවෘත්ති තුනක් ලියන්න.

தொலைக்காட்சி அல்லது வானொலிச் செய்தி அறிக்கையைக் கேட்டு அதில் குறிப்பிடப்பட்ட வெளிநாட்டுச் செய்திகள் மூன்றினை எழுதுக.